ආයතනයේ නම :- උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් - ශීර්ෂ අංක 04
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ
නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் :- உயர் நீதிமன்ற நீதியரசர்கள் – செலவினத் தலைப்பு 04
பாராளுமன்ற அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை
தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின்
அவதானிப்புக்கள் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளை
பாராளுமன்றத்துக்கு சமர்ப்பித்தல்.

Name of the Institution : Judges of the Superior Court – Head 04
Submission of observations of Hon.Minister and steps taken with regard
to the reports tabled by the committee on public Accounts in terms of
standing order No.119(4)

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183**

**ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු**

**2020 මුදල් වර්ෂය**

| | කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා | දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාල 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2021.03.03 දින අධිකරණ අමාත්‍යාංශයේ රජයේ විගණන අංශය වෙත යොමු කර ඇත. |
| 02. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට 2022 වර්ෂයේ සිට කටයුතු සලසා ඇත. |
| 03. | 2002.09.12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුලත වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නැත. | 2020වර්ෂයේ කාර්ය සාධන වාර්තාව 2020/2021 වර්ෂවල පැවති කෝවිඩ් තත්ත්වය හමුවේ නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වී ඇති අතර එම වාර්තාව 2022 ජුනි මස වන විට අවසන් කර 2022 නොවැම්බර් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට භාරදී ඇත. |
| 04. | කාර්ය මණ්ඩලයේ සියලු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි. | මෙතෙක් ලබාදී නොමැති අය වෙත ලිඛිතව රාජකාරී පැවරීම් සිදුකරනු ලැබේ. |
| 05. | 2017.09.20 දිනැති අංක 04/2017 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි. | මේ වනවිට කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබේ. |

රෙජිස්ට්‍රාර් - ශ්‍රේෂ්ඨාධිකරණය

o/c.

ප්‍රදීප් මහමුතුගල
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.

23.01.2023 වන දින
ශ්‍රේෂ්ඨාධිකරණයේ දී ය.

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183

## ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

## 2020 මුදල් වර්ෂය

| | කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා | දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 1. | තොරතුරු දැන ගැනීමේ පනතට අනුව තම ආයතනයේ තොරතුරු ලබාදීම සඳහා නිශ්චිත නිලධාරියෙකු පත් කර නොතිබුණි. | තොරතුරු දැනගැනීමේ පනතට අනුව තොරතුරු නිලධාරියෙකු 234 වැය ශීර්ෂය - ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සඳහා පත්කර ඇතත් උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් සඳහා අදාල නොවේ. |
| 2. | මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම / ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වා නොතිබුණි. | අදාල නොවේ. |
| 3. | ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි. | අදාල නොවේ. |
| 4. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ගරු අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් පත්කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසිනි. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට ඒ සඳහා කටයුතු කල නොහැක. |
| 5. | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ විදේශ පුහුණු අවස්ථා ලබාදීමේ හැකියාවක් නොතිබිණි. |
| 6. | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | අදාල නොවේ. |
| 7. | මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි. | අදාල නොවේ. |
| 8. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | Covid ව්‍යාප්ති තත්ත්වය තුල පුහුණු අවස්ථා නොතිබුනි. |

රෙජිස්ට්‍රාර් - ශ්‍රේෂ්ඨාධිකරණය

o/c.

ප්‍රදීප් මහමුතුගල
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.

23. 01. 2023 වන දින

ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය.